රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක
இல.
No.
130

# නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජයේ නිලධරයන්

# புதிய அரசியலமைப்பின் கீழ் அரசாங்க உத்தியோகத்தர்கள்

# Public Officers under the New Constitution

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.

මිළ/விலை/Price:- 1.40

තැපැල් ගාස්තුව/தபாற்செலவு/Postage : -/50

මගේ අංකය: 543 ඊ 397 ඕ.
ආයතන අංශය,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7, 1978 ඔක්තෝබර් මස 18 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

## නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජයේ නිලධරයන්

අමාත්‍ය මණ්ඩලයේ නියෝගය පිට නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IX වැනි පරිච්ඡේදයේ විවිධ ව්‍යවස්ථාවන් මගින් තමන්ට පැවරී ඇති බලතල යටතේ කැබිනට් මණ්ඩලය එළඹ ඇති තීරණ ඇතුළත් වේ.

**හැඳින්වීම**

1 : 1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි රජයේ නිලධරයන් සම්බන්ධයෙන් කරුණු දැක්වෙන ප්‍රධාන කොටස වනුයේ 55 සිට 61 දක්වා වූ ව්‍යවස්ථාවන් ය.

1 : 2 170 වැනි වගන්තිය—අර්ථ නිරූපනය—රජයේ නිලධරයා යන්නෙන් අධිකරණ නිලධරයකු හැර, ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් වශයෙන් හැඳින්වෙන අතර ඊට—

(අ) ජනාධිපතිවරයා ;
(ආ) කථානායකවරයා ;
(ඇ) අමාත්‍යවරයෙක් ;
(ඈ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;
(ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;
(ඊ) නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ;
(උ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ;
(ඌ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ;
(එ) ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් ;
(ඒ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්

ඇතුළත් නොවන්නේ ය.

1 : 3 55 සිට 59 දක්වා වූ ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ වන්නේ,

(අ) ජනාධිපතිවරයා විසින් කෙළින් ම පත්කරනු ලබන රජයේ නිලධරයන් ද,
(ආ) සන්නද්ධ සේවාවල සාමාජිකයන් ද,
(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 114 (6) වැනි ව්‍යවස්ථාවෙහි අර්ථ නිරූපනය කර ඇති "උපලේඛනගත රජයේ නිලධාරීන්" ද හැර සෙසු රජයේ නිලධරයන්ට ය.

එහෙයින් මෙම චක්‍රලේඛයේ විධිවිධාන මෙම තුන් ගණයට අයත් රජයේ නිලධරයන්ට හැර සෙසු සියලුම රජයේ නිලධරයන්ට අදාළ වන්නේ ය.

1 ඊ 37269—12,010 (78/10)

1 : 4 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රජයේ නිලධරයන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහකිරීම් හා විනය පාලනය යන මේ කරුණු ගැන අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් තීරණවලට එළඹ ඇත.

**රජයේ නිලධරයන් පත්කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලනය කිරීම**

2 : 1 උසස් කිරීම් සහ වැටුප් වැඩිකිරීමක් සිදුවන මාරු කිරීම් ද පත්වීම්වලට ඇතුළත් ය.

2 : 2 මාරු කිරීම යන්නෙන් රජයේ නිලධරයෙකු වැටුපෙහි වෙනසක් නොමැතිව එකම සේවයෙහි එක තනතුරකින් වෙනත් තනතුරකට හෝ එකම අමාත්‍යාංශයේ නැතහොත් දෙපාර්තමේන්තුවේ එකම ශ්‍රේණියේ එක් තනතුරකින් වෙනත් තනතුරකට හෝ මාරු කිරීම අදහස් වේ.

2 : 3 මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙක් යනු, මූලික ඒකාබද්ධ වාර්ෂික වැටුප රු. 6,720 ක් වූ හෝ ඊට වැඩිවූත්, වාර්ෂික වැටුප් වර්ධකය රු. 360 ක් වූත්, ඊට වැඩිවූත් රජයේ නිලධරයෙකි.

2 : 4 දෙපාර්තමේන්තු ප්‍රධානයන් පිළිබඳ පත්කිරීමේ, මාරු කිරීමේ, සේවයෙන් පහකිරීමේ සහ විනය පාලනය කිරීමේ බලය, 55 (2) වැනි ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලයට පැවරේ.

2 : 5 (අ) අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්,
(ආ) දිස්ත්‍රික්ක භාර දිසාපතිවරුන්,
(ඇ) අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්,

පිළිබඳ පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය කිරීම් ගැන අමාත්‍ය මණ්ඩලය කෙළින්ම කටයුතු කරනු ඇත.

2 : 6 (අ) දෙපාර්තමේන්තු ප්‍රධානයන්,
(ආ) අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්,
(ඇ) දිස්ත්‍රික්ක භාර දිසාපතිවරුන්,
(ඈ) අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්,

පිළිබඳ පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලන කිරීම් සම්බන්ධ සංදේශ අදාළ අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයට එවනු ඇත. ඒකාබද්ධ සේවයේ නිලධරයන් සම්බන්ධයෙන් "අදාළ ඇමතිවරයා" වන්නේ රාජ්‍ය පරිපාලනය භාර ඇමතිවරයා වන අතර අදාළ අමාත්‍යාංශය භාර ඇමතිවරයා විමසා එබඳු සංදේශ ඔහු විසින් එවනු ඇත.

2 : 7 "අදාළ ඇමතිවරයා" සහ "අදාළ අමාත්‍යාංශය" යනුවෙන් පිළිවෙලින් අදහස් වන්නේ, අදාළ රජයේ නිලධරයා වැඩ කරන දෙපාර්තමේන්තුව නැතහොත් ආයතනය භාර ඇමතිවරයා සහ අමාත්‍යාංශයයි.

2 : 8 (අමාත්‍යාංශ ලේකම්වරුන් හැර) ජනාධිපතිතුමාණන් විසින් පත් කරන ලද තැනැත්තන් භාරව ඇති කාර්යාල සම්බන්ධයෙන් "අදාළ ඇමතිවරයා" වනුයේ ජනාධිපති උතුමාණන් ය. පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය සම්බන්ධයෙන් "අදාළ ඇමතිවරයා" වනුයේ සභානායක වශයෙන් පත්වී සිටින ඇමතිවරයා ය.

**2 : 9** අමාත්‍යාංශ කාර්යාලයක් සම්බන්ධයෙන් "දෙපාර්තමේන්තු ප්‍රධානයා" වනු ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරයා ය.

**2 : 10** සෙසු රජයේ නිලධරයන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ බලය අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවා කොමිසමට පවරා ඇති අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින්, රජයේ නිලධර යන්ගේ පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය කිරීම පිළිබඳ සිය බලය පහත 2 : 11 ඡේදයේ විස්තර කෙරෙන රජයේ නිලධරයන් වෙත පවරා ඇත.

2 : 11 මුළු රජයේ සේවය සම්බන්ධයෙන්,
ව්‍යවස්ථා අංක 55(2) ත්
ඇතැම් බලතල තබා ගැන්මට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණයත්,
අමාත්‍ය මණ්ඩලය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරීමත්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවකයන්ට බලතල පැවරීමත්,
මත පදනම් වූ තත්ත්වය පහත දැක්වෙන පරිදි වන්නේ ය.

2 : 11 : 1 පත් කිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය

| වර්ගය | විස්තරය | බලධාරී |
|---|---|---|
| 1 | දෙපාර්තමේන්තු ප්‍රධානයන් | අමාත්‍ය මණ්ඩලය |
| | අමාත්‍යාංශ අතිරේක ලේකම් වරුන් | |
| | දිසාපතිවරුන් | |
| | අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් | |
| 2 | ඒකාබද්ධ සේවාවන්හි මාණ්ඩ ලික ශ්‍රේණිවල රජයේ නිල ධරයන් | රාජ්‍ය පාරිපාලන අමාත්‍යාංශයේ ලේකම්. |
| 3 | (අ) ඒකාබද්ධ සේවාවන්ට නොගැනෙන මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධර යන් | අදාල අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයක් යටතේ නොගැනේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානයා. |
| | (ආ) ඒකාබද්ධ සේවාවන්ට නොගැනෙන විගණකාධි පති දෙපාර්තමේන්තුවේ සහ මැතිවරණ දෙපාර්ත මේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධර යන් | ජනාධිපති ලේකම් |
| 4 | ඒකාබද්ධ සේවාවන්හි මාණ්ඩ ලික ශ්‍රේණිවල නොවන රජ යේ නිලධරයන් | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ |
| 5 | ඒකාබද්ධ සේවාවන්හි නොගැනෙන්නා වූත් මාණ්ඩ ලික ශ්‍රේණිවල නොවූත් රජයේ නිලධරයන් | දෙපාර්තමේන්තු ප්‍රධානයා |

**2 : 11 : 2 මාරු කිරීම්—**

| වර්ගය | විස්තරය | බලධාරී |
|---|---|---|
| 1 | දෙපාර්තමේන්තු ප්‍රධානයන්<br>අමාත්‍යාංශ අතිරේක ලේකම්වරුන්<br>දිසාපතිවරුන්<br>අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් | අමාත්‍ය මණ්ඩලය |
| 2 | ඒකාබද්ධ සේවයේ මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධරයන්— | |
| | (අ) අමාත්‍යාංශයෙන් බැහැර | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් |
| | (ආ) අමාත්‍යාංශයක් තුළ | අදාළ අමාත්‍යාංශයේ ලේකම් |
| | (ඇ) දෙපාර්තමේන්තුවක් තුළ | දෙපාර්තමේන්තු ප්‍රධානයා |
| 3 | (අ) ඒකාබද්ධ සේවාවන්හි නොගැනෙන මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධරයන් | අදාළ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයක් යටතේ නොවේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානයා |
| | (ආ) ඒකාබද්ධ සේවාවන්ට නොගැනෙන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ මැතිවරණ දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධරයන් | ජනාධිපති ලේකම් |
| 4 | ඒකාබද්ධ සේවාවන්හි මාණ්ඩලික ශ්‍රේණිවල නොගැනෙන රජයේ නිලධරයන්— | |
| | (අ) අමාත්‍යාංශයෙන් බැහැර | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ |
| | (ආ) අමාත්‍යාංශයක් තුළ | අදාළ අමාත්‍යාංශයේ ලේකම් |
| | (ඇ) දෙපාර්තමේන්තුවක් තුළ | දෙපාර්තමේන්තු ප්‍රධානයා |
| 5 | ඒකාබද්ධ සේවාවන්හි නොගැනෙන්නා වූත් මාණ්ඩලික ශ්‍රේණිවල නොවූත් රජයේ නිලධරයන්— | |
| | (අ) අමාත්‍යාංශයක් තුළ | අමාත්‍යාංශයේ ලේකම් |
| | (ආ) දෙපාර්තමේන්තුවක් තුළ | දෙපාර්තමේන්තු ප්‍රධානයා |

2 : 12 58 (2) වැනි ව්‍යවස්ථාවේ නිශ්චිතව දැක්වූ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ලැබෙනු ඇත. එනම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් යම් රජයේ නිලධරයෙකු වෙත බලය පවරා දෙනු ලැබුවේද, ඒ රජයේ නිලධරයා විසින් කරන ලද මාරුකිරීමේ හෝ සේවයෙන් පහකිරීමේ නියමයකින් නැතහොත් විනය කටයුත්තක් සම්බන්ධව කරන ලද වෙනත් යම් නියමයකින් අතෘප්ත කවර හෝ රජයේ නිලධරයකුට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට අයිතියක් ඇත්තේ ය.

### බඳවා ගැනීමේ පරිපාටි

3 : 1 රජයේ සේවයේ සෑම තනතුරක් සඳහා ම එහි වැටුප් පරිමාණය, අවශ්‍ය සුදුසුකම්, වයස් සීමා සහ එවැනි වෙනත් විස්තර දක්වෙන බඳවා ගැනීමේ පරිපාටියක් තිබිය යුතුය. 1972. 07. 01 වන දිනය සහ අංක 54 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 : 1 වන ඡේදයේ නියමිත පරිදි 78. 09. 06 වන දින වන විට අනුමත කර තිබෙන රජයේ සේවයේ තනතුරු පිළිබඳ බඳවා ගැනීමේ පරිපාටි, මින් මතු කෙරෙන වෙනස් කිරීම්වලට යටත්ව, තව දුරටත් වලංගුව පවතිනු ඇත.

3 : 2 නව බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කළයුතු වුවහොත් හෝ පවතින බඳවා ගැනීමේ පරිපාටියක් විෂයෙහි යම් වෙනසක් සිදුකළ යුතු වුවහොත්, අදාළ අමාත්‍යාංශය එම නව බඳවා ගැනීමේ පරිපාටිය හෝ සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය පිළියෙල කොට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතුය. යෝජිත නව බඳවා ගැනීමේ පරිපාටියට නැතහොත් සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය එකඟවන අවස්ථාවන්හිදී එබඳු පරිපාටි අනුමත වූ සේ සලකා, අනුමැතිය ලැබීමත් සමඟම ක්‍රියාත්මක විය යුතුය. එහෙත් බඳවා ගැනීමේ පරිපාටිය පිළිබඳ ව අදාළ අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අතර මතභේද යක් ඇතිවිටෙක, පරිපාටිය පිළියෙල කළ අමාත්‍යාංශය විසින් තීරණයක් සඳහා එම කරුණ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළයුතුය. බඳවා ගැනීමේ පරිපාටිය බෙහෙවින්ම වෙනස් කර ඇති විටෙක, යෝජිත වෙනසට තමන් එකඟ වුවත් එම පරිපාටිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය උදෙසා ඉදිරිපත් කළයුතු යයි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අදාළ අමාත්‍යාංශයට යෝජනා කළ හැක.

3 : 3 රජයේ සේවයට කෙරෙන සියලුම බඳවා ගැනීම් ඉහත දැක්වුණු 3 : 1 වන හා 3 : 2 වන ඡේදයන් ගෙන් නියමිත පරිදිව අනුමත කෙරුණු බඳවා ගැනීමේ පරිපාටි අනුව සිදුකළ යුතුය. අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව, ස්ථිර හෝ තාවකාලික පදනමක් මත පත්වීමක් දීමට යම් පත්වීම් බලධාරියකු අදහස් කරතොත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ එකඟත්වය ලබාගත යුතුය. අදාළ අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය අතර මතභේද යක් ඇතිවූ අවස්ථාවක, තීරණයක් ගැනීම සඳහා එම කරුණ අදාළ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළයුතුය.

### ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම

4 : 1 පහත සඳහන් වන අවස්ථාවන්හිදී හැර පොදු නියමයක් වශයෙන්, රජයේ සේවයේ සියලුම පුරප්පාඩු සඳහා ප්‍රසිද්ධ දැන්වීම් පළකළ යුතුය :—

(i) අමාත්‍ය මණ්ඩලය විසින් කෙළින්ම කරනු ලබන පත්කිරීම් ;

(ii) බඳවා ගැනීම ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් කිරීම අවශ්‍ය නැති බවට 78. 09. 06 වන දින වන විට නියමිතව තිබුණු අවස්ථාවලදී ;

(iii) අමාත්‍ය මණ්ඩලය එසේ කිරීම අනවශ්‍ය යයි විධාන කරන අවස්ථා වලදී

4 : 2 දෙපාර්තමේන්තුවක් හෝ සේවාවක් ඇතුළත උසස්වීම් සම්බන්ධයෙන් හෝ නියමිත විශේෂ සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව අඩුකම නිසා ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම අවශ්‍ය නොවන්නේ යයි පත්කිරීමේ බලධරයා තීරණය කරන විශේෂ අවස්ථාවන්හිදී හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම අවශ්‍ය නොවනු

ඇත. තනතුරක් ස්ථිර වශයෙන් දරන්නාකු ඇති අවස්ථාවක ඒ තනතුරට කෙරෙන වැඩ බැලීමේ පත්වීම් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම අවශ්‍ය නොවන්නේ ය.

4:3 ප්‍රසිද්ධ දැන්වීම් පළකළ යුත්තේ පත්වීම් බලධාරී විසිනි.

4:4 රජයේ සේවයේ පුරප්පාඩු පිළිබඳ සියලුම ප්‍රසිද්ධ දැන්වීම් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට උදක්ම අනුකූල විය යුතුය.

4:5 එසේ ප්‍රසිද්ධ දැන්වීම් පළකරන ලද තනතුරු සඳහා ඉල්ලුම් පත් ලැබුණු විට, බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත සුදුසුකම් ඉල්ලුම් කරුවන්ට තිබේ දැයි සොයා ගැනීමට පරීක්ෂා කර ඒවා උපලේඛන ගතකළ යුතුය. මෙය කළ යුත්තේ පත්කිරීමේ බලධරයාගේ කාර්යාලයෙහි ය. එහෙත්, බඳවා ගැනීම, විභාග දෙපාර්තමේන්තුව විසින් පැවැත්වෙන විභාගයක් මගින් කෙරෙන අවස්ථාවන්හි දී ඉල්ලුම් පත් භාර ගැනීම සහ උපලේඛන ගතකිරීම විභාග දෙපාර්තමේන්තුව විසින් කෙරෙනු ඇත.

**තේරීම් මණ්ඩල හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල**

5:1 අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් තේරීම් මණ්ඩලයක් හෝ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හෝ පත්කිරීමට නියම කර ඇති අවස්ථාවන්හි දී, පත්වීම් කරන බලධරයා අදාළ මණ්ඩලය පත්කරනු ඇත.

5:2 බඳවා ගැනීමේ පරිපාටියෙහි වෙනත් ලෙස නියම කර ඇත්නම් මිස එම සෑම මණ්ඩලයකම යටත් පිරිසෙයින් එක් සාමාජිකයකු වත්, පුරප්පාඩුව පවත්නා අමාත්‍යාංශයෙන් හෝ දෙපාර්තමේන්තුවෙන් අන්‍ය වූ වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ අයත් විය යුතුය.

**පත්වීම් ලිපි**

6:1 අමාත්‍ය මණ්ඩලය විසින් කෙළින්ම කෙරෙන පත්කිරීම් සම්බන්ධයෙන්, පත්වීම් ලිපි අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ නිකුත් කෙරෙනු ඇත.

6:2 අන් සියලු පත්කිරීම් සම්බන්ධයෙන් පත්වීම් ලිපි, පත්වීම් බලධාරියා නිකුත් කරනු ඇත.

6:3 පත්වීම් ලිපි අවශ්‍ය වෙනස්වීම් සහිතව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 43 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ 22 වැනි උප ග්‍රන්ථයේ සඳහන් වන ආකෘතීන්ට අනුකූල විය යුතුය.

**වැඩ බැලීමේ පත්වීම්**

7:1 රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන සියලු වැඩ බැලීමේ පත්කිරීම්, මුල් තනතුරෙහි පුරප්පාඩුවක් ඇතත්, නැතත්, අදාළ තනතුරට මුල් පත්කිරීම කිරීමට බලය ලත් බලධරයා විසින් කළ යුතුය. තනතුරක වැඩ බැලීමට පත් කරනු ලබන නිලධරයෙකුට, අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත සුදුසුකම් තිබිය යුතුය.

7:2 පත්කරනු ලැබීම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නියමිත සුදුසුකම් සහිත පුද්ගලයකු නැත්නම් ද, තනතුර වහාම පිරවීමට අවශ්‍ය නම් ද, ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13:5 වගන්තිය අනුව තනතුරේ රාජකාරී “ඉටුකිරීම” සඳහා ඉතා ම සුදුසු නිලධරයා පත් කළ හැක.

**ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හා සංස්ථාවලට නිලධරයන් මුදාහැරීම**

8 : 1 රජයේ සංස්ථාවක සේවය සඳහා රජයේ නිලධරයකු තාවකාලික හෝ ස්ථිරව හෝ මුදාහැරිය යුතු වන විට අදාළ යම් නීතියක් ඇතිනම් ඊට යටත්ව, එම රජයේ සංස්ථාව ක්‍රියා කරන්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද එම අමාත්‍යාංශය අදාළ නිලධරයා පත්කළ බලධරයාගේ ද, ඔහු සේවය කරන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ ද අවසරය ලබාගත යුතුය.

**රජයේ නිලධරයන් සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳ ක්‍රියා පරිපාටි**

9 : 1 අමාත්‍ය මණ්ඩලය, රජයේ නිලධරයන් සම්බන්ධයෙන් තමන් විසින් පැවරු තම බලතල අනුව, සේවයෙන් පහකිරීමේදී හෝ විනය පාලන කිරීමේදී යොදා ගතයුතු වන ක්‍රියා පරිපාටි, යථාකාලයේදී සම්පාදනය කරනු ඇත. මෙම නීති නිකුත් කෙරෙන තෙක්, ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ විධිවිධානයන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අනුගමනය කළ යුතුය.

**රජයේ නිලධරයන් මාරු කිරීම්**

10 : 1 මාරු කිරීම් කරනු ලබන්නේ 2 : 11 : 2 වැනි ඡේදයේ පිළිවෙලින් දැක්වූ බලධාරීන් විසිනි.

10 : 2 මාරු කිරීම් කළයුත්තේ, ආයතන සංග්‍රහයේ III වැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධානයන්ට හැකිතාක් දුරට අනුකූල වෙමිනි.

**ස්ථිර කිරීම්, පරිවාස කාලයන් දීර්ඝ කිරීම්, විශ්‍රාම ගැනීම් හා ඉල්ලා අස්වීම්**

11 : 1 රජයේ නිලධරයන් ස්ථිර කිරීම, ඔවුන්ගේ පරිවාස කාලයන් දීර්ඝ කිරීම හා ඔවුන්ගේ විශ්‍රාම ගැනීම් හා ඉල්ලා අස්වීම් පිළිගැනීම, නිලධරයා දරන තනතුරට හෝ ඔහු අයත් සේවාවට පත්වීම් කිරීම ගැන වගකිව යුතු බලධරයා විසින් කළ යුතුය.

**වැටුප් වර්ධකයන් අනුමත කිරීම**

12 : 1 රජයේ නිලධරයන්ගේ වැටුප් වර්ධකයන් අනුමත කිරීම, අවශ්‍ය වෙනස්කම් සහිතව ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 10 වැනි ඡේදයේ නිශ්චිත බලධරයන් මගින් ම කළ යුතුවේ.

12 : 2 විනය කරුණු මුල්කර ගෙන වැටුප් වර්ධකයක් අත්හිටුවන විට, එබඳු නිලධාරියකු සම්බන්ධයෙන් විනය පාලනය කරන බලධාරියාගේ අනුමැතිය ඇතිව කළ යුතුය.

**රජයේ නිලධරයන්ගේ පැවැත්ම පිළිබඳ රීති මාලා; උසස් කිරීම් හා මාරු කිරීම් සිදු කිරීමේදී අනුගමනය කළයුතු ප්‍රතිපත්ති; රජයේ නිලධරයන් පත්කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහකිරීම් හා ඔවුන්ගේ විනය පාලනය යන මේ කරුණු ක්‍රියාත්මක කිරීමේ පරිපාටිය හා එකී බලතල පවරා දීමේ පරිපාටිය**

13 : 1 ආයතන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදයේ සිට XLVIII පරිච්ඡේදය දක්වා වූ විධිවිධාන ද, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් හෝ ආයතන අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලදුව 1978. 09. 06 දින බල පැවැත් වූනු සියලුම චක්‍රලේඛ ද අවශ්‍ය වෙනස්කිරීම් සහිතව හා මෙම චක්‍රලේඛයේ විධිවිධානවලින් කිසිවකට පටහැනි නොවනතාක් දුරට මතුවට ද බලපැවැත් වෙන්නේ ය.

2–ඒ37269 (78/10)

**කටයුතු අවසන් කර නැති කරුණු**

**14 : 1** නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට පෙර රජයේ නිලධරයකුගේ පත්කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම හෝ විනය පාලනය සම්බන්ධයෙන් කටයුතු අරඹන ලදුව, 1978. 09. 06 දින වනතුරුත් අවසන් කර නොමැති සියලුම කරුණු සම්බන්ධයෙන් නව දුරටත් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ගය ගැන මේ චක්‍රලේඛය අනුව පත්කිරීම්, මාරු කිරීම් හෝ සේවයෙන් පහකිරීම් හා විනය පාලනය පිළිබඳ වගකීම් පැවරී ඇති අභිනව බලධරයාගෙන් විමසිය යුතුය.

**14 : 2** පත්කිරීම් සඳහා අයදුම්කරුවන් තෝරා ගනු පිණිස මිට කල්තියාම තේරීම් මණ්ඩල පත්කර තිබුණේ නම්, එම තේරීම් මණ්ඩලවල නිර්දේශ, මෙම චක්‍රලේඛය අනුව ඒ ඒ පත්කිරීම් සම්බන්ධයෙන් දැනට වගකිව යුතු බලධරයා වෙත යැවිය යුතුයි.

**14 : 3** දැනට කෙරෙමින් පවත්නා විනය පරීක්ෂණ, නව දුරටත් පවත්වා සම්පූර්ණ කොට එම පරීක්ෂණ පැවැත්වූ නිලධරයාගේ හෝ විනිශ්චය මණ්ඩලයේ හෝ වාර්තාව, මෙම චක්‍රලේඛය අනුව, අදාළ නිලධරයාට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ බලය දැනට පැවරී ඇති බලධරයා වෙත යැවිය යුතුය.

**පත්වීම් ආදිය වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට අමාත්‍ය මණ්ඩලයට ඇති බලය (59 වැනි ව්‍යවස්ථාව)**

15 : 1 “ (අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ එම කොමිෂන් සභාවේ කමිටුවක් විසින් හෝ අභියාචනයේ දී නැතහොත් අන්‍යාකාරයකින් කරන ලද යම්කිසි පත්කිරීමක්, මාරු කිරීමේ නැතහොත් සේවයෙන් පහකිරීමේ නියමයක් හෝ විනය කටයුත්තක් සම්බන්ධව කරන ලද වෙනත් යම්කිසි නියමයන් වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ද ;

(ආ) අමාත්‍යවරයකු විසින් කරන ලද යම්කිසි මාරු කිරීමේ නියමයක් වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ද ;

(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ එම කොමිෂන් සභාවේ කමිටුවක් විසින් හෝ 58 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ බලය පවරා දෙනු ලැබූ රජයේ නිලධරයකු විසින් කරන ලද යම්කිසි පත්කිරීමක් වෙනස් කිරීමට, අමුතු කිරීමට හෝ අවලංගු කිරීමට ද,

අමාත්‍ය මණ්ඩලයට බලය බලය ඇත්තේ ය ”.

**16.** **1972 ජූලි 1** වෙනි දින අංක 54 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ද, මෙම **චක්‍රලේඛයෙහි විධිවිධානවලට අනුකූල** නොවන අන්‍ය චක්‍රලේඛවල විධිවිධාන ද මෙම **චක්‍රලේඛය මගින් අවලංගු** වන්නේ **ය.**

Siriwardhana

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.